

# ඔවුනට ඔබේ පිහිට අවශ්‍ය ය

## එන්න අපි එක් වී මේ අසරණ පවුලට අත දෙමු





අංක 963, 4 වන පටුමග, සැළලිහිණිගම, බෝගස්වැව, වවුනියාව ලිපිනයේ පදිංචි ටී.එම්.දුලාංජලි කුමාරි මහත්මිය හා පී.එච්.උපුල් විජේකුමාර මහතා ජීවත්වීමට දරන්නේ අපමණ දුකකි.

ස්ථිර රැකියාවක් නොමැති අසනීප තත්ත්වයෙන් (මී මැස් මොර රෝගයෙන්) පසුවන උපුල් විජේකුමාර මහතා සිය දරු පවුල රැක ගැනීමට කුලී වැඩ කරයි.

ඔවුනගේ කැදැල්ලේ දරු දෙදෙනෙකු සිටින නමුත් බාල දරුවා ස්නායු රෝගයකට ලක්ව දෙපා පණ නැති රෝගී තත්වයෙන් පෙළෙයි. මෙම දරුවා මුලදී නුවර මහරෝහලේ ප්‍රතිකාර ලැබූ නමුත් ආර්තික අපහසුතා නිසා වවුනියාව රෝහලට මාරුවීමක් ගෙන ඇත. සෑම සතියකම සදුදා දිනයේ ස්නායු ආබාධිත දරුවා වවුනියාව රෝහලට රැගෙන යා යුතු නමුත් වවුනියාව දක්වා බස් රථයේ ගමන් කිරීමටවත් තමන්ට වත්කමක් නොමැති තත්වයක් උදා වි ඇති බැව් දරුවාගේ මව පැවසුවාය.

කුමාරි මහත්මිය පැවසුවේ කුඩා දරුවා උපත ලබන මොහොතේ නිරෝගී තත්ත්වයෙන් පසුවුවද දරුවාගේ කොඳු ඇට පෙළේ ඇති වූ ගෙඩියක් ශල්‍ය කර්මයකට ලක් කිරීමෙන් අනතුරුව දරුවාගේ දෙපා පණ නැති තත්වයක් උදාවූ බවයි.

දරුවාගේ රෝගී තත්ත්වයට වියදම් කිරීමට කුලී වැඩ කරන තම ස්වාමියාට නොහැකි තත්ත්වයක් උදාවී ඇති අතර, මේ වන විට තමන්ට දිනකට වේලක්වත් කෑමට නොහැකි තත්ත්වයකට තම පවුල මුහුණ දී ඇති බැව්ද කුමාරි මහත්මිය සදහන් කළාය.

වැඩිමහල් දරුවා පෙර පාසල් යන අතර මෙම දරුවාද කුසගින්නේ පසුවන වාර අනන්තය.

තමන් ඉටිකොළ හා තහඩු ආවරණය කළ පැළක ජීවත්වන අතර, අසනීප දරුවා තබා ගැනීමටවත් තම නිවසේ පහසුකම් නොමැති බැව් කුමාරි මහත්මිය පැවසුවාය.

ඔවුනට අතහිත දීම සඳහා අපි එක්ව සිටින්නෙමු. අප එක් එක් අයගේ ඉතා කුඩා පරිත්‍යාගයකින් පවා විශාල වෙනසක් කළ හැකි බව අපි තේරුම් ගෙන ඇත්තෙමු. ඕනෑ කමක් ඇත්නම් අපට කළ හැකි දේ අපමණය. මේ අසරණ දරු පවුලට අත දීම සඳහා ඔබත් අප හා එක්වන්න.

අපගේ අරමුණ වන්නේ අදාළ දරු පවුල වෙත නිවසක් සාදා දිම සහ දරුවාට සුවය ලබා දිමයි. එයට ඔබෙන් ලැබෙන සහය ඉතා අගය කරන්නෙමු.

ඔබ අප වෙත එවන සෑම ඩොලරයකටම විශාල වටිනා කමක් ඇති බව සිතන්න.

**වැඩි දුර විස්තර සඳහා**
Sumeda – 0423 688 482
Theõ– 0434 165 507
Rasika - 0403 303 585
Nayaí - 0425 787 484

SBS සිංහල සේවය

**SBS සිංහල සේවය සඳුදා, අගහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා**
**පෙ.ව 11 සිට 12 දක්වා**

සජීවව online අහන්න
www.sbs.com.au/radio - select - SBS radio 2 -Sinhalese

පසුව online අහන්න
www.sbs.com.au/sinhalese
සජීවව on TV - Channel 38

**සජීවව** on Radio
93.1fm - Victoria
97.7fm - NSW
105.5fm - Canberra
106.3fm - SA
93.3fm - QLD
96.9fm - WA

සජීවව හෝ පසුව via Mobile
SBS Radio APP - free download

SBS සිංහල Facebook පිටුව
www.facebook.com/sbssinhalese

කතාකරන්න - (03) 99492169
Fax කරන්න - (03) 99492385
කෙටි පණිවිඩ සඳහා - 042 999 6263
(වැඩසටහන ප්‍රචාරය වන වෙලාවේදී පමණි)

# ගිරිඋල්ල දැතව කනිටු විදුහලේ පුස්තකාලයට පොත් අවශයයි

**ප්‍රියංකර නිවුන්හැල්ල**



මගෙ ගුරු ජීවිතයේ වසර 25 අඩකටත් වඩා ගෙවී ගියේ දුෂ්කර පාසල්වලය. සම අධ්‍යාපන අවස්ථා ගැන කතා කළත් දුෂ්කර පාසල් වල තත්වය ශෝ කාන්ත නාට්‍යයක් යැයි කීම අතිශයොක්තියක් නොවේ. මා දැනට සේවය කරන පාසලේ දරුවන්ට කෑම බීම ඇඳුම් පැළඳුම් වැනි මූලික අවශ්‍යතා පවා සපුරා ගැනීම දුෂ්කරය. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයට අවශ්‍ය ලැප්ටොප් පරිගණක ප්‍රින්ටර් ආදිය අපට නැත. එහෙත් රජයේ ප්‍රතිපාදන බලා නොසිට ඔවුන් වෙනුවෙන් යමක් සොයා ගෙන සහන සැලසීම අපගේ උත්සාහයයි. අපගේ පාසල වන ගිරිඋල්ල දැතව කනිටු විදුහලේ සාහිත්‍ය උත්සවයක් පැවැත් වීමට ද අපි දැන් කට යුතු සූදානම් කරමින් සිටිමු ,

ආසියාවේ ආශ්චර්යය යැයි කීවද අපේ පාසල්වල දරුවන්ගේ උදේ ආහාරය ගැන විමසූ විට ඔවුන්ගේ පිලිතුර වන්නේ "පොලූයි බතුයි" යන්නයි. මේ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා වෙනුවෙන් ඔබ කරන ඔනෑම උපකාරයක් අනාගත මාතෘ භූමියේ පුරවැසියන් වෙනුවෙන් බව සිතීම වැදගත් යැයි සිතමු ,

අපේ පාසලේ දරුවන් දකින මට නිටිතර සිහියට එන්නේ රත්නශ්‍රී විජේසිංහයන්ගේ කවියකි

**ඉස්කෝලේ මනා හෙවනට බැඳුන**
**මකුලු දැලේ උදු වියනේ මුතු බඳින**
**සීතල හිරි කඩ දෙපතුල් ළඟ හඬන**
**සකි සඳුනේ සුවනැත දළ රළු යහන**

"මට පොත් එවනවාට වඩා මා උගන්වන දුප්පත් පාසලේ පුස්තකාලයට පොත් ටිකක් ලබා ගන්නට වැඩ පිළිවෙලක් යෙදිය හැකි නම් එය විශාල සේවාවකි" යි කිව්යර ප්‍රියංකර නිවුන්හැල්ල මහතා අපට පැවසුවේ ඔහුට යම් පොතක් යවන්නට කතා කළ අවස්ථාවේදීය.

ඔහු උගන්වන්නේ ගිරිඋල්ල දැතව කණිටු විදුහලේ ය. පහසුකම් අඩු පාසලක් වන දැතව කණිටු විදුහලේ පුස්තකාලය සඳහා පොත්පත් ලබාගැනීමට සහය වන්නැයි අපි



සන්නස පාඨක ඔබ සැමගෙන් ඉල්ලා සිටිමු. කණිටු විදහලක සිසුනට ප්‍රයෝජනවත් විය හැකි යයි ඔබ සිතන පොත් පත් ඔබ වෙත තිබේ නම් ඒවා සන්නසට බාර දෙන්න. මේ පොත් පත් හැලම් හි සන්නස කාර්යාලයට හෝ තෝමස්ටවුන් හි සූර්ය මාකටිං සර්විසස් ආයතනයට ගෙනැවිත් බාරදිය හැකිය.

සිංහල හෝ කුඩා ඉංග්‍රීසි පොත් මේ සඳහා


දැතව කනිෂ්ඨයේ
ශිෂ්‍ය නායක නායිකාවෝ

සුදුසු යයි අපි සිතමු. පොත් ලබාදිය නොහැකි නම් ඔවුන්ට එම පොත් මිලට ගැනීම සඳහා මූල්‍යමය ආධාරයක් කරන්නටද ඔබට හැකිය.

ඔබ ලබාදෙන කුඩා පොතක් දරුවකුගේ මුවේ අපූරු සිනා මලක් පුබුදුවනු ඇත. එය කොයිතරම් වටිනවාද?